# සවියෙන් පෙරට අපි එකට

## ඊ - ඉගෙනුම් පාසල

## හොරණ අධ්‍යාපන කලාපය

# බුද්ධ ධර්මය - 6 ශ්‍රේණිය

# 21 පාඩම

# සැදැහැ ගුණයෙන් සරු වෙමු.

සැකසුම :- ආර්. ඩී. උදාරා ලක්මාලි

බප/ හො/ පතහවත්ත ශ්‍රී ස්වර්ණජෝති මහා විද්‍යාලය






මං දැන් මොකද කරන්නේ





එක් උපාසකයෙක් විහාරස්ථානයේ සිල් සමාදන් වී පසුදා පහන් වන තුරු සිල් රකිමින් සිටියා.

පසුදා උදෑසන පන්සලේ හාමුදුරුවෝ සිල් පවාරණය සඳහා ධර්ම ශාලාවට වැඩම කළා.

හාමුදුරුවෝ :- මොකද උපාසක උන්නැහේ හිටගෙන.

උපාසකතුමා :- හාමුදුරුවනේ මේ පැත්තෙ කිරිවෙහෙර වහන්සේ, අර පැත්තෙ ශ්‍රී මහා බෝධීන් වහන්සේ, අනෙක් පැත්තෙ කැලණි වෙහෙර වහන්සේ,එහා පැත්තේ ශ්‍රී පාද පද්මය.ඉතින් කොහොමද හාමුදුරුවනේ ඒ එක පැත්තකටවත් දෙපා දමා නිදාගන්නේ.

හාමුදුරුවෝ :- උපාසක උන්නැහේ, ඕකට කියන්නේ **අමූලික ශ්‍රද්ධාව** කියලා.

# මොකද්ද මේ ශ්‍රද්ධාව කියන්නේ,

ශ්‍රද්ධාව යනු
බුදුන්, දහම්, සඟුන් යන තෙරුවන් කෙරෙහි
ඇති පැහැදීම යි.

# ශ්‍රද්ධාව

- අමූලික ශ්‍රද්ධාව
- ආකාරවතී ශ්‍රද්ධාව

- අවබෝධයකින් තොරව ඇති වන්නේ **අමූලික ශ්‍රද්ධාව** යි.
- තෙරුවන් කෙරෙහි අවබෝධයෙන් ඇතිකර ගන්නා පැහැදීම **ආකාරවතී ශ්‍රද්ධාව** යි.

දස්සන කාමෝ සීලවතං
සද්ධම්මං සෝතුමිච්ඡති
විනෙය්‍ය මච්ඡේර මලං
සවෙ සද්ධෝති වුච්චති.







- සිල්වතුන් දැකීමට කැමැති වීම.
- දහම් ඇසීමට කැමති වීම.
- මසුරු මල දුරු කොට පරිත්‍යාග කිරීමට කැමති වීම.

ශ්‍රද්ධාවන්තයෙකු සතු ලක්ෂණ වේ.



# ශාසනික වචන





1. වඩිනවා - එනවා / යනවා
2. වළඳනවා - කෑම කනවා / පැන් පානය කරනවා
3. පැන් - ජලය
4. දැත් දෝවනය - අත් සේදීම
5. අවුළුපත් - අතුරුපස
6. දැහැත් - බුලත් විට
7. මල් නෙළීම - මල් කැඩීම
8. පැන් ඉසීම - වතුර ඉසීම
9. ගිලන්පස - තේ කෝපි වැනි බීමට ගන්නා දේ
10. සැතපෙනවා - නිදාගන්නවා
11. පැන් පහසු වෙනවා - දිය නානවා
12. අමදිනවා - අතුගානවා













# ඇගයීම

1. තෙරුවන් නම් කරන්න.
2. ශ්‍රද්ධාවේ ප්‍රභේද දෙක මොනවාද ?
3. බෞද්ධයකු තුළ පැවතිය යුත්තේ කුමන ශ්‍රද්ධාව ද ?
4. සැදැහැවතෙකු තුළ තිබෙන ලක්ෂණ තුන මොනවාද ?
5. පහත සඳහන් වචන සඳහා ශාසනික වචන ලියන්න.

    නිදාගන්නවා
    අනුරුපස
    අනුගානවා
    දිය නානවා
    කෑම කනවා



# පිළිතුරු

1. බුද්ධ රත්නය, ධම්ම රත්නය, සංඝ රත්නය

2. අමූලික ශ්‍රද්ධාව , ආකාරවතී ශ්‍රද්ධාව

3. ආකාරවතී ශ්‍රද්ධාව

4. සිල්වතුන් දැකීමට කැමැති වීම.
   දහම් ඇසීමට කැමැත්ත තිබීම.
   මසුරු මල දුරු කොට පරිත්‍යාග කිරීමට කැමති වීම.

5. සැතපෙනවා
   අවුළුපත්
   අමදිනවා
   පැන් පහසු වෙනවා
   වළඳනවා



# තෙරුවන් සරණයි!